# 'චූදිතයා කෙරෙහි නීතියේ රැකවරණය' බෞද්ධ විනය ඇසුරෙන් විමසුමක්

පූජ්‍ය, මාහරගම ජිනරතන හිමි[1]

## හැඳින්වීම

නීතියේ ප්‍රධාන කාර්යයක් වන්නේ සාධාරණ ලෙස යුක්තිය ඉටු කිරීම යි. එසේ සාධාරණ විනිශ්චයක් ලබා දීමට නම් පැහැදිලි ක්‍රමවේදයක් නීති පද්ධතියෙහි අන්තර්ගත විය යුතු ය. එය අත්තනෝමතික ක්‍රියා පටිපාටියක් නො විය යුතු ය. එහි විනිවිද බවක් තිබිය යුතු ය. නීතිය ඉදිරියට යන චූදිතයාට සාධාරණ විනිශ්චයක් ලැබිය යුතු ය. හුදෙක් චූදිතයා වරදකරුවෙකු වීමට පෙර හා පසු ඔහු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග සාධාරණ විය යුතු ය. මානව අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ නඩු විභාගය පැවැත්වීම නීතියේ කාර්යභාරය යි.

බෞද්ධ විනයනීති පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කිසියම් විනිවිද බවක් විනය ක්‍රියාමාර්ගයන් තුළ අනුගමනය කළ බව පැහැදිලි වෙයි. පුද්ගලයන්ට ලබා දෙන කායික දඬුවම් පිළිබඳ ඍණාත්මක දෘෂ්ටියක් හෙළන බුදුසමය අත්තනෝමතික ව පුද්ගලයන්ට එරෙහි ව නීතිය ක්‍රියාත්මක කිරීම අනුමත නො කරයි. බුදුසමය අවධාරණය කරන පරිදි නීතිය ක්‍රියාත්මක කිරීමේ දී එහි පැහැදිලි විනිවිද බවක් තිබිය යුතු අතර, නීතියේ රැකවරණය පතන්නන්ට කිසිඳු අසාධාරණයක් නො විය යුතු ය.

## පර්යේෂණ ක්‍රමවේය

සාහිත්‍ය මූලාශ්‍රය පදනම් කොට ගෙන සිදු කරනු ලබන පර්යේෂණයේ දී පොදුවේ අනුගමනය කරනු ලබන ක්‍රමවේද මෙහි දී ද අනුගමනය කර ඇත. එහි දී මුලින් ම ප්‍රාථමික මූලාශ්‍රයන්ට අදාළ දත්ත ඒකරාශී කර ඇත. එසේ ම විෂය කරුණු සම්බන්ධ ප්‍රාමාණික උගතුන් සම්මුඛ වී කරුණු සාකච්ඡා කිරීමෙන් හා ද්විතීයික මූලාශ්‍රයන්හි දැක්වෙන කරුණු සමඟ තුලනාත්මක ව හා විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමෙන් ප්‍රකට වන කරුණු ඓතිහාසික හා තර්කානුකූල පදනමක් යටතේ වර්ගීකරණය කොට පර්යේෂණය සිදු කර ඇත.

## පර්යේෂණ ගැටලුව

බෞද්ධ විනයනීති පද්ධතියෙහි අන්තර්ගත චූදිතයා කෙරෙහි නීතියේ රැකවරණය සැලසීමට අදාළ ඉගැන්වීම්වල ස්වභාවය කෙබඳු ද?

## පර්යේෂණ උපන්‍යාසය

බෞද්ධ විනයනිතීන් මඟින් අවධාරණය වන යුක්තිය පසිඳලීමේ දී අනුගමනය කර ඇති විවිධ සංකල්ප මඟින් චූදිතයාගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත වන අයුරුත් නූතන නීති පද්ධතියට එහි ඇති අදාළත්වය ද අවබෝධ කරගත හැකි ය.

[1]. ශාස්ත්‍රවේදී (ගෞරව-බෞද්ධ අධ්‍යයනය), පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
*maharagamarathana@gmail.com*

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල**

නඩු විභාගයකදී 'චෝදක', 'චෝදනාව' හා 'චූදිත' යනුවෙන් ප්‍රධාන සාධක තුනක් ඇත. 'චෝදක' යනු කිසියම් කරුණක් වැරැද්දක් යැයි ප්‍රකාශ කරන පුද්ගලයා යි. ඔහු විසින් ඉදිරිපත් කරන්නේ චෝදනාවකි. එහි 'දෝෂාරෝපණය' යන අදහසක් ගැබ් වෙයි. චෝදනාව ලබන්නේ චූදිතයා ය. 'චූදිතයා' වශයෙන් හඳුන්වන්නේ නඩු විභාගයක දී වරද සම්බන්ධයෙන් මූලික වන පුද්ගලයා ය. ඔහු අපරාධය සම්බන්ධයෙන් වරදකරුවා වීමට පෙර සිට ම මෙම නමින් හඳුන්වයි. බෞද්ධ විනය ශික්ෂාවන් පණවන ලද්දේ ද භික්ෂු සමාජයේ ඇති වූ කිසියම් සිදුවීමක් පදනම් කරගෙන ය. ඒ නිසා විනයශික්ෂාව පැණවීමට අදාළ සිද්ධියෙහි ද චූදිතයෙකු සිටීම අනිවාර්ය වෙයි. යම් අවස්ථාවන්වල මහරහතන් වහන්සේලාට එරෙහි ව ද යම් යම් චෝදනාවන් එල්ල වූ අතර, එවැනි ප්‍රශ්නවල දී චූදිතභූමිකාව මහරහතන් වහන්සේ නිරූපණය කරයි. එක් අවස්ථාවක මෙත්තිය හා භුම්මජක යන තෙරවරුන් දෙනම මෙත්තියා නම් භික්ෂුණිය යොදවා ගෙන දබ්බමල්ල මහරහතන් වහන්සේට දූෂණ චෝදනාවක් එල්ල කළේ ය. එම චෝදනාවට අදාළ නඩු විභාගයේ දී චූදිතයා බවට පත් වන්නේ දබ්බමල්ල මහරහතන් වහන්සේ ය (විනයපිටකය, **පාරාජිකපාළි,** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිටුව 424.). බොහෝ අවස්ථාවන්වල විනයශික්ෂාවන් පැණවීමට හේතුව වන්නේ ශික්ෂණය පිරිහුණු භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියාකාරකම් ය. එහි දී උන්වහන්සේලා චූදිතයන් වශයෙන් සිය භූමිකාව නිරූපණය කරයි.

කිසියම් වරදක් සිදු කළ විට එම භික්ෂූන් වහන්සේට අදාළව විනය ක්‍රියාමාර්ග ගෙන අවශ්‍ය දඬුවම නියම කරන්නේ සඞ්ඝාධිකරණය හමුවෙහි ය. එසේ ම භික්ෂූන් වහන්සේලා අතර ඇතිවන වාද විවාද විසඳන්නේ අධිකරණසමථ මඟින් ය. මෙම අධිකරණසමථ ක්‍රියාවලියෙන් ද චූදිතයා කෙරෙහි දක්වන බෞද්ධ ආකල්පය විග්‍රහ කළ හැකි ය.

සම්මුඛාවිනය සමථයේ දී කිසියම් චෝදනාවක් පිළිබඳ ව භික්ෂූන් වහන්සේලා රැස්ව අධිකරණසමථයක් ගැනීමේ දී ඒ සඳහා අනිවාර්යයෙන් ම චෝදනාව ලබන භික්ෂූන් වහන්සේ සම්බන්ධ විය යුතු ය (විනයපිටකය, **චුල්ලවග්ගපාළි,** බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (2005). දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිටුව 212.). චූදිතයා නොමැති ව යම් විනය ක්‍රියාමාර්ගයක් ගන්නේ ද එය වලංගු නො වෙයි. එසේ චූදිතයාගේ සහභාගීත්වය අනිවාර්ය වන්නේ සිය නිදහස උදෙසා අවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීමේ නිදහස ඇති බැවිනි. මහරහතන් වහන්සේ නමක් වුව චූදිතයෙක් වුවහොත් සිය රහත්භාවය පිළිබඳ ප්‍රතිඥාවක් දිය යුතු ය. ඒ අනුව අපට පැහැදිලි වන්නේ සිය නිදහස උදෙසා කරුණු දැක්වීමේ නිදහස බෞද්ධ විනය තුළින් චූදිතයාට ලබා දී ඇති බව යි.

බෞද්ධ විනයට අනුව සඞ්ඝාධිකරණය හමුවට එන චූදිතයාගේ මානසික මට්ටම පිළිබඳ ව ද අවධානය යොමු කර නඩු විභාගය පැවැත්වීම සුවිශේෂ කරුණකි. ඒ අනුව සිහිවිකල් ව සිටිය දී කරන ලද වැරදිවලට උම්මත්තක ස්වභාවය සුව වීමෙන් පසු නැවත චෝදනා කර චූදිතයාව පීඩාවට පත් නො කරයි. එසේ ම වරද කරන ලද කාලයේ සම්මත ව තිබෙන දඬුවමට වඩා වැඩි දඬුවමක් ලබා දීම ද බුදුසමයෙන් ප්‍රතික්ෂේප කරයි. එය විනය මඟින් මානව අයිතිවාසිකම් සුරක්ෂිත වන බව දැක්වීමට ඇති

සාධකයකි. බෞද්ධ අධිකරණ ක්‍රියාවලියේ දී චූදිතයා පිළිබඳ ව විශ්වාසය තැබීම ද එක් විශේෂ කරුණකි. පටිඤ්ඤාතකරණසමථයේ දී සිදු වන්නේ චූදිතයාගෙන් අවඞ්ක ව සත්‍ය ලෙස ලබා ගන්නා ප්‍රතිඥාව මත නඩු විසඳීමකි (විනයපිටකය, **චුල්ලවග්ගපාළි**, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිටුව 212.). ඒ අනුව පූර්ණ විශ්වාසයක් චූදිතයා කෙරෙහි ඇත. එය ද සිය නිදහස උදෙසා අධිකරණමය අවස්ථාවක දී සිය අදහස් දැක්වීමට ඇති අයිතිය තහවුරු කිරීමකි.

බෞද්ධ අධිකරණයේ දී චූදිතයා වැරදිකරුවා බවට පත් වුවහොත් ඔහු වෙනුවෙන් දඬුවම් නියම කරන්නේ කුමන පරමාර්ථයෙන් ද යන්න ද විමසා බැලීම අගනේ ය. තස්සපාපියසිකාසමථයේ දී නිතර නිතර වැරදි කරන භික්ෂුවට පාපී භික්ෂුව යන නාමය ලබා දෙයි (විනයපිටකය, **චුල්ලවග්ගපාළි**, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (2005). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිටුව 218.). එයින් බලාපොරොත්තු වන්නේ සිය වැරදි සම්බන්ධයෙන් කිසියම් ලජ්ජාවක් ඇති කර හික්මීමට යොමු කිරීම යි. චූදිතයෙක් වූ නිසාවෙන් වැරදිකරුවකු ලෙස හැඳින්වීම සාධාරණ නො වෙයි. එසේ ම වැරදි මාර්ගයෙන් මිදී යහපත් මාර්ගයට ප්‍රවිෂ්ට වීමට අවස්ථාවක් ද ලබා දිය යුතු ය. බෞද්ධ විනයෙන් මේ කාරණය ඉටු වෙයි. මේ නිසා බෞද්ධ අධිකරණය ඉදිරියට පැමිණෙන චූදිතයා සම්බන්ධයෙන් සාධාරණ හා අපක්ෂපාති ලෙස විනය ක්‍රියාමාර්ග ගන්නා අතර, ඔහුගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි නැවත පුනරුත්ථාපනය වීමක් ද බෞද්ධ විනයෙන් සිදු වෙයි.

**පර්යේෂණ නිගමනය**

බෞද්ධ විනයට අනුව චුදිතයා වරදකරුවෙකු කර ප්‍රශ්නය විසඳීම බෞද්ධ පිළිවෙත නො වෙයි. පුද්ගල පාරිශුද්ධිය ඇති කිරීමට අවශ්‍ය පදනමත් ශාසනික චිරස්ථිතිය ඇති කිරීමට අවශ්‍ය පදනමත් බෞද්ධ විනයෙන් සකස් කරයි. නූතන නීතියට අනුව චූදිතයා වැරදිකරුවකු වුවහොත් ඉහළ ම දඬුවම වශයෙන් මරණීයදණ්ඩනය හිමි වෙයි. නමුත් බෞද්ධ විනයට අනුව ලබා දෙන බරපතල ම දඬුවම වන්නේ බ්‍රහ්මදණ්ඩනය යි. මෙමඟින් සිදු වන්නේ චූදිතයා සමඟ කතා කිරීමෙන් හා ඔහුට අවවාද කිරීමෙන් වැළකීම යි. මෙය සාමාන්‍යයෙන් පුද්ගලයෙකුට දරාගත නො හැකි තත්ත්වයක් නිසා නිරායාසයෙන් ම සිය වැරදි නිවැරදි කරගෙන යහපත් මාර්ගයට ප්‍රවිෂ්ට වෙයි. මේ අනුව අපට පෙනී යන්නේ චූදිතයා වැරදිකරුවෙකු වීමට පෙරත් වැරදිකරු බවට පත් වීමෙන් අනතුරු ව ද ඔහු පිළිබඳ සානුකම්පික දෘෂ්ටියක් හෙළන බුදුසමය ඔහුව නැවත යහපත් තත්ත්වයෙන් සමාජගත කිරීමට උත්සාහ ගන්නා බව යි. එය සැබැවින් ම චූදිතයාගේ මානව අයිතිවාසිකම් සුරක්ෂිත වීමකි.

**ප්‍රමුඛ පද:** විනය, නීතිය, අයිතිවාසිකම්, චූදිතයා

**මූලාශ්‍රය**


- **චුල්ලවග්ගපාළි.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **පාරාජිකපාළි.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- චන්‍දවිමල හිමි, රේරුකානේ (2005). **බුද්ධනීති සඞ්ග්‍රහය.** පොකුණුවිට: ශ්‍රී විනයාලඞ්කාරාමය.
- තිලකරත්න, මහානාම (2014). **උසාවිය මානව හිමිකම් හා නීතියේ ආධිපත්‍ය.** කොළඹ: සමයවර්ධන පොත්හල.